(අටවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(3).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 පෙබරවාරි 07 වැනි සිකුරාදා**

---

## 2020 පෙබරවාරි 18 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 1),— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 3(ඔ) වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ සායනික පරීක්ෂණ සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 2),— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 21 දිනැති අංක 2146/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 02 දිනැති අංක 2143/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.02.05 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## 2020 මාර්තු 03 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ක්‍රීඩාගාර අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) නිසි නඩත්තුවක් නොමැති වීම හේතුවෙන් ඉදිරියේදී ජාත්‍යන්තර තරඟ පැවැත්වීමට නොහැකි තත්ත්වයක් උද්ගත විය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ 2016, 2017 හා 2018 යන වර්ෂයන්හිදී පැවැත්වූ ජාත්‍යන්තර ක්‍රිකට් තරඟ සංඛ්‍යාව;

(ii) එම තරඟවලින් ලැබුණු ආදායම;

(iii) උක්ත වර්ෂ තුළ ක්‍රීඩාංගණයේ කටයුතු සඳහා වෙන් කළ මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

45/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල - බණ්ඩාරවෙල මාර්ගයේ, 2 වැනි සැතපුම් කණුව අසල පාලම දැඩි ලෙස අබලන් වී ඇති බව දන්නේද;

(ii) මෙම පාලම හරහා ප්‍රවේශ විය යුතු ගම්මානවල නම් කවරේද;

(iii) මෙම පාලමේ ඇති පෞරාණික බව ආරක්ෂා වන පරිදි නවීකරණය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

72/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ පවතින රැකියා වියුක්ති අනුපාතය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා වියුක්ති ගැටලුව සඳහා ලබාදෙන විසඳුම් කවරේද;

(iii) එම විසඳුම් මඟින් සපුරා ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් කවරේද;

(iv) එම ඉලක්කයන් සපුරා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

119/2020

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යයාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනගත් පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

139/2020

ගරු බිමල් රත්නායක මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 නියං සහනාධාර අදියර II යටතේ සහන ලබා දී ඇති දිස්ත්‍රික්ක කවරේද;

(ii) ඒ සඳහා තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ඒ සඳහා වැය කළ මුළු මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ සඳහා නිකුත් කළ චක්‍රලේඛ කවරේද;

(iv) ඒ අතරින් අවසන්වරට ක්‍රියාත්මක වූ වලංගු චක්‍රලේඛය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වලංගු චක්‍රලේඛයට අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ ඒ සඳහා වැයකළ මුළු මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කවරේද;

(ii) අවලංගු වන අවස්ථාව වනවිට අංක NDRC/2018/03 චක්‍රලේඛයට අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ හඳුනාගෙන තිබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පීඩාවට පත් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) පොල්පිතිගම එයට ඇතුළත් නොවන්නේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

149/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වී ඇති මූල්‍ය සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් හා අධ්‍යක්ෂ මණ්ඩල කවරේද;

(iii) යහපාලන රජය බලයට පැමිණි දින සිට මූල්‍ය අර්බුදවලට ලක් වූ මූල්‍ය සමාගම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) එම එක් එක් මූල්‍ය සමාගමේ තැන්පතු පවත්වාගෙන ගොස් ඇති තැන්පතුකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු කිරීම සඳහා මෙතෙක් ගනු ලැබූ හා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර නගර සභා බලප්‍රදේශය තුළ ඇති වැලිකන්ද ග්‍රාමය නාය යෑමේ දැඩි අවදානම් ප්‍රදේශයක් ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් නම් කර ඇති බවත්;

(ii) වැලිකන්ද ග්‍රාමයේ වැසියන්ට මහනුවර, හන්තාන, ගලහ වත්තේ ඉඩම් හා නිවාස ඉදිකිරීමට ණය මුදල් ද ලබා දී ඇති බවත්;

(iii) මෙම ප්‍රදේශයේ විශාල යන්ත්‍රෝපකරණ යොදාගෙන පැරණි පඩිපෙළ වෙනුවට පාරක් කපන බවත්;

(iv) මෙම පස් කැපීමට නිසි අවසරයක් ලබාගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය කැපීම නතර කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(iii) මෙම නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

48/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති පිරිවෙන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිවෙන්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් පිරිවෙනෙහි ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සහ සේවය කරන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ පිරිවෙන් අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

76/2020

ගරු හේෂා විතානගේ මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගොඩ ඉඩම් නොමැති පුද්ගලයන්ට තම කුඹුරු ඉඩමෙන් පර්චස් 10ක කොටසක් ගොඩකර නිවසක් ඉදිකර ගැනීමට අවසර ලබාදීම දීර්ඝ කාලයක සිට පැවති බව දන්නේද;

(ii) දැනට ගොඩ ඉඩම් අහිමි පුද්ගලයන්ට තම කුඹුරු ඉඩමෙන් පර්චස් 10 ක පමණ කොටසක් ගොඩකර නිවසක් ඉදිකිරීම සඳහා ලබා දී තිබූ අවස්ථා අහිමි කර ඇති බව පිළිගන්නේද;

(iii) එම නිසා දිවයිනේ විවිධ ප්‍රදේශවල ඉඩම් නොමැති විශාල පිරිසක් අසරණ තත්ත්වයකට පත්ව සිටින බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුඹුරු ඉඩමෙන් පර්චස් 10ක ප්‍රමාණයක් ගොඩකර ගැනීම සඳහා මේ වනවිට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයදුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම පුද්ගලයන්ට ඉතා කඩිනමින් එම පර්චස් 10ක කුඹුරු ඉඩම් ගොඩකර ගැනීමට අවස්ථා සලසා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

140/2020

ගරු බිමල් රත්නායක මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 නියං සහනාධාර අදියර I යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iii) මෙහි II අදියර සඳහා පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් එකම ප්‍රතිලාභියෙක් හෝ තෝරා නොගත් බව දන්නේද;

(iv) එසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රාදේශීය ලේකම්වරයා ක්‍රියාත්මක කර ඇත්තේ අංක NDRSC/2018/03 දරන අවලංගු කරන ලද චක්‍රලේඛය බව පිළිගන්නේද;

(ii) වලංගු චක්‍රලේඛය වන අංක NDRSC/2018/03 ii ක්‍රියාත්මක නොකළේ මන්ද;

(iii) 2018.10.22 දින ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රතිලාභීන් නොමැති බව අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාට ලිඛිතව දැනුම් දී ඇත්තේ අවලංගු කරන ලද චක්‍රලේඛයේ 4 වන වගන්තියේ උපදෙස්වලට අනුකූලවද;

(iv) අවලංගු කරන ලද චක්‍රලේඛයේ 4වන වගන්තිය උල්ලංඝනය කර ඇති බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

150/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ලැබූ ආදායම හා කරන ලද වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාලසීමාව තුළ රූපවාහිනී සංස්ථාවට බඳවාගත් පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් හා තනතුරු නාම කවරේද;

(iii) එසේ සේවකයන් බඳවාගැනීමට අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(iv) ජාතික රූපවාහිනිය තුළ නිදහස් මාධ්‍ය කලාවකට දොරටු විවර කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

157/2020

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල නව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපිට පිහිටි ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් භුක්ති විඳින ඉඩමක් එහි සේවකයන් අතර බෙදා දීමට කටයුතු කර ඇති බවත්;

(ii) එහෙත් මෙම ඉඩම්වල අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය සතු වන බවත්;

(iii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මෙම ඉඩම් සඳහා ඔප්පු ලබා නොදෙන ලෙස දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත ලිඛිතව දන්වා ඇති බවත්;

(iv) මේ පිළිබඳව මොනරාගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ විරුද්ධත්වය ප්‍රකාශ කර තිබියදී මෙම ඉඩම් බෙදා දීම සිදුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් මෙම ඉඩම් බදු පදනම මත ජනතා වතු සංවර්ධන මණ්ඩලය ලබාගෙන තිබියදී ඔප්පු නිකුත් කිරීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලයට බලයක් තිබේද;

(ii) මෙම තත්ත්වය තුළ නීත්‍යානුකූල නොවන ලෙස කර ඇති මෙම ඉඩම් බෙදාදීම තහනම් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2020 මාර්තු 04 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

6/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සමාජ අසමානතාවය හා සම්පත් බෙදී යාම සාධාරණව සිදු නොවීම හේතුවෙන් ශ්‍රී ලංකාවෙන් දරිද්‍රතාවය තුරන් කිරීමට අපහසු වී ඇති බවත්;

(ii) දැනට ක්‍රියාත්මක විෂයානුබද්ධ අධ්‍යාපන ක්‍රමය තුළින් කුසලතා වර්ධනය නොවීමෙන් කාලීන සමාජයට ගැලපෙන වෘත්තිකයන් බිහි නොවන බවත්;

(iii) නෛතික යන්ත්‍රණයේද යුක්තිය පසිඳලීමේ ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රමවත්ව සිදු නොවන බවත්;

(iv) උක්ත සියලු කරුණු රටේ තරුණ ප්‍රජාවට සෘජුවම බලපාන බවත්;

(v) තරුණයන් සමාජ විරෝධී කටයුතු කෙරෙහි යොමු වීමට මෙම අසහනකාරී මානසිකත්වය බලපාන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පාසල් අධ්‍යාපනය අතරමග නවතන තරුණ ප්‍රජාව වෘත්තීය පුහුණු හෝ වෙනත් විධිමත් ජීවනෝපාය මාර්ග වෙත යොමු කිරීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) පාසල් අධ්‍යාපනය රැකියා වෙළෙඳපොළට ගැළපෙන ලෙස සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර තිබේද;

(iv) එසේ නම්, එම යෝජනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

63/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිවැරදි කාලගුණික අනාවැකි පළකිරීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත කර ඇති රේඩාර් පද්ධති සංඛ්‍යාව කොපමණද;

(ii) එම රේඩාර් පද්ධති ස්ථාපිත කර ඇති ස්ථාන කවරේද;

(iii) දැනට එම රේඩාර් පද්ධති අතරින් ක්‍රියාවිරහිත වී ඇති රේඩාර් පද්ධති කවරේද;

(iv) එසේ ක්‍රියා විරහිත වී ඇති රේඩාර් පද්ධති අලුත්වැඩියා කිරීම සඳහා අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

89/2020

ගරු හේෂා විතානගේ මහතා,— ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තනතුරු සඳහා පුද්ගලයන් පත් කර ගනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) එක් එක් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණය තුළ විශාල අල්ලස් ලබාදීමේ ක්‍රියාවලියක් සිදුවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, මෙම නිලවරණය විනිවිදභාවයකින් සිදුකිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

141/2020

ගරු බිමල් රත්නායක මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නියං සහනාධාර ලබාදීම වෙනුවෙන් නිකුත් කරන ලද අංක NDRSC/2018/03 චක්‍රලේඛයේ 04 වගන්තිය අනුව පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සෑම ග්‍රාම නිලධාරි වසමකම ක්ෂේත්‍ර නිලධාරින් තිදෙනෙකුගෙන් යුත් කමිටු පත් කර තිබේද;

(ii) එසේ නම්, රැස්වූ වාර ගණන, දින, වේලාවන්, ස්ථාන, පැමිණීම, න්‍යාය පත්‍රය සහ සාකච්ඡා සටහන් ඉදිරිපත් කරන්නේද;

(iii) කිසිදු ප්‍රතිලාභියෙක් නොමැති බවට කමිටුව ඒකමතිකව නිර්දේශකර තිබේද;

(iv) එම නිර්දේශය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මීට අදාළව ප්‍රාදේශීය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් අදාළ නිලධාරින්ගෙන් සමන්විත කමිටුව රැස්වී තිබේද;

(ii) එසේ නම්, එම රැස්වීම් පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) කිසිදු ප්‍රතිලාභියෙක් නොමැති බවට කමිටුව ඒකමතිකව නිර්දේශ කර තිබේද;

(iv) එම නිර්දේශය ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2018 නියං සහනාධාර අදියර II ක්‍රියාත්මක කිරීමේදී පොල්පිතිගම ජනතාවට අසාධාරණයක් සිදු වූ බව පිළිගන්නේද;

(ii) එය නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) අදාළ සහනාධාර ජනතාවට ලබා දෙන්නේද;

(iv) වැරදිකරුවන්ට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

151/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය වාර්ෂිකව ඉපැයූ ආදායම, වැයකරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලසීමාව තුළ බඳවාගත් සේවකයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් හා තනතුරු නාම කවරේද;

(iii) එකී කාලසීමාව තුළ ස්වාධීන රූපවාහිනිය මාධ්‍ය ජාලය තුළ නිදහස් මාධ්‍ය කලාවක් ඇති කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(iv) ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය තුළ චෝදනාවලට ලක්වූවන්ට එරෙහිව ගෙන ඇති පියවර සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "සීමාසහිත ශ්‍රී ලංකා ව්‍යවසාය සංවර්ධන සමූපකාර සමිතිය" ලියාපදිංචි කළ දිනය කවරේද;

(ii) එම සමිතියේ නිලධාරි මණ්ඩලයේ තනතුරු හා එම තනතුරු දරන පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම සමිතිය ලියාපදිංචි කිරීමේ කටයුතු නීත්‍යානුකූල නොවන බවත්;

(ii) සමූපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේදී සලකා බැලිය යුතු කිසිදු සාධකයක් සම්බන්ධයෙන් අවධානය යොමුකර නොමැති බවත්;

(iii) මේ සම්බන්ධයෙන් විධිමත් සමිති ලියාපදිංචි ලිපිගොනුවක් දෙපාර්තමේන්තුව තුළ නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) එසේනම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

64/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මේ වනවිට සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් හා මේ වනවිට ඔවුන් දරන තනතුරු කවරේද;

(iii) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දැනට සේවක පුරප්පාඩු හා වෙනත් අඩුපාඩු තිබේ නම්, එම අඩුපාඩු අවම කිරීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

90/2020

ගරු හේෂා විතානගේ මහතා,— ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වත්මන් නිලධාරි සංයුතිය කවරේද;

(ii) ඔවුන්ට ගෙවන වැටුප්, දීමනා හා වෙනත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පසුගිය කාලය තුළ ඇතැම් නිලධාරීන් ක්‍රිකට් ක්‍රීඩාව නංවාලීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ උන්නතිය වෙනුවෙන් කිසිදු සේවයක් ඉටු නොකර වරප්‍රසාද භුක්ති විඳිමින් සිටින බව දන්නේද;

(iv) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ තුළ සිදුවන සමහර ක්‍රියාදාමයන් මඟින් ශ්‍රී ලාංකීය ක්‍රිකට් ක්‍රීඩාවට ඉතා ගැටලුකාරී තත්ත්වයක් උදාවන බව පිළිගන්නේද;

(v) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තුළ සිදුවන මූල්‍ය අක්‍රමිකතා වැනි සුලභ සිදුවීම් වැළැක්වීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 මාර්තු 05 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

22/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂය තුළ නීති විරෝධීව මෙරටට ආනයනය කළ කුඩා දරුවන්ගේ සෙල්ලම් බඩු ශ්‍රී ලංකා රේගුව මඟින් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, අත්අඩංගුවට ගත් සෙල්ලම් බඩුවල වටිනාකම කොපමණද;

(iii) උක්ත සෙල්ලම් බඩු ගෙන්වූ රටවල් කවරේද;

(iv) එම නීති විරෝධී ආනයනයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එම නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සෙල්ලම් බඩු නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස මෙරට ව්‍යාප්ත කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

65/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් සිසුන්ට පාසල් බෑග් ලබාදීම සඳහා ඌව පළාත් සභාව විසින් මිල ගණන් ඉදිරිපත් කරන ලෙස දන්වන ලද ආයතන කවරේද;

(ii) ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ සමාගම්වල නම්, ලිපිනයන් හා අදාළ මිල ගණන් කවරේද;

(iii) මිල ගණන් කැඳවීමට පෙර අවශ්‍ය බෑග්වල පිරිවිතරයන් සකස් කර තිබුණේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(iv) මේ සම්බන්ධයෙන් විගණන වාර්තාවේ දැක්වෙන කරුණු අනුව නිවැරදි කිරීම් සිදු කිරීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

91/2020

ගරු හේෂා විතානගේ මහතා,— ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර 10ක කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ආදායම් සහ වියදම් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය වසර 10ක කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ආදායම් සහ වියදම් පිළිබඳව අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් වූ විගණන මත කවරේද;

(iii) ක්‍රිකට් ආයතනය තුළ දිගින් දිගටම සිදුවන මූල්‍ය අක්‍රමිකතා වැළැක්වීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

142/2020

ගරු බිමල් රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 සිට 2017 දක්වා කොළඹ, ගාල්ල, මාතර, නුවර, කුරුණෑගල, යාපනය සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජාතික පාසල්වල,

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු කවරේද;

(ii) ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත 6 වැනි ශ්‍රේණියට ඇතුලත් වූ ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 5 ශ්‍රේණියේ සහ 6 ශ්‍රේණියේ සමාන්තර පන්ති සංඛ්‍යාව කොපමණද;

(iv) 6 වැනි ශ්‍රේණියට ශිෂ්‍යත්ව ප්‍රතිඵල පදනම් කර නොගෙන ප්‍රාථමික අංශයේ සිට පැමිණි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(v) 6 ශ්‍රේණියේ මුළු සිසුන් සංඛ්‍යාවෙන්, ශිෂ්‍යත්ව ප්‍රතිඵල මත ඇතුලත් වූ සිසුන්ගේ ප්‍රතිශතය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

152/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සතු ගුවන් විදුලි සේවා සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට එම එක් එක් ගුවන් විදුලි සේවාව ඉපැයූ ආදායම හා නඩත්තු වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට බඳවාගත් සේවක සංඛ්‍යාව, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩසටහන් ජනතාව අතර ජනප්‍රිය කරවීමට මෙතෙක් ගෙන ඇති පියවර සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

23/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂය තුළ නීති විරෝධීව මෙරටට ආනයනය කළ පාසල් උපකරණ ශ්‍රී ලංකා රේගුව මඟින් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, අත්අඩංගුවට ගත් පාසල් උපකරණවල වටිනාකම කොපමණද;

(iii) උක්ත පාසල් උපකරණ ගෙන්වා ඇති රටවල් කවරේද;

(iv) එම නීති විරෝධී ආනයනයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එම නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාසල් උපකරණ නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැවින් මෙරට නිෂ්පාදන ආරක්ෂා කිරීම සඳහා ආනයනය පාලනය කිරීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

66/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාවේ පාසල් බෑග් සැපයීමේ ව්‍යාපෘතියේ සැපයුම්කරු ලෙස අංක 100, කඳන, ස්ප්‍රිංවැලි යන ලිපිනයේ පිහිටි වීරසිංහ ඩිස්ට්‍රිබියුටර්ස් සමාගම තෝරාගෙන තිබූ බවත්;

(ii) එම ලිපිනයේ කිසිදු ව්‍යාපාරික කටයුත්තක් සිදු නොකරන බව විගණන විමසුමේ දැක්වෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සමාගම විදුලි උපකරණ බෙදා හැරීම සඳහා පමණක් යු/හා/785 දරන වෙළඳ සමාගමක් ලෙස ලියාපදිංචිව සිටියදී, ඌව පළාත් සභාව විසින් පාසල් බෑග් සැපයීම සඳහා එම සමාගමට අවසර දීමේ නීතිමය පසුබිම කවරේද;

(ii) මෙහිදී සිදු වී ඇති අතිශය වංචනික කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

93/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බලවින්න උදාකළ ගම්මානයේ ලබා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම උදාකල ගම්මානය ජනතා අයිතියට පත්කරන ලද දිනය කවරේද;

(iii) එම නිවාසලාභීන් සඳහා මෙතෙක් හිමිකම් ඔප්පු ලබා දී නොමැති බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම හිමිකම් ඔප්පු ලබාදීමට ගනු ලබන කඩිනම් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

143/2020

ගරු බිමල් රත්නායක මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වේච්ඡා පොලිස් කොස්තාපල්වරුන් ලෙස සේවය කළ පුද්ගලයන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 9/1374/360/047 ට අනුව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3–II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ බවත්;

(ii) එම පිරිස ගුරු හිඟයක් පැවති වැලිඔය වැනි දුෂ්කර ප්‍රදේශවල සේවයට යෙදවූ බවත්;

(iii) මේ හේතුවෙන් ගුරු හිඟය නිසා වැසී යාමට ආසන්නව පැවති එම ප්‍රදේශවල පාසල් යළි නඟා සිටුවීමට හැකිවූ බවත්;

(iv) එසේ වුවද, ඔවුන්ගේ විරෝධය නොතකා ඔවුන් යළි ස්වේච්ඡා පොලිස් සේවයට අනුයුක්ත කිරීමේ උත්සාහයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔවුන්ගේ ඉල්ලීම පරිදි එම පිරිස ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිර කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

153/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කය තුළ වැලි ගොඩදැමීම සඳහා අවසර ලබා දී ඇති ස්ථාන කවරේද;

(ii) එම ස්ථානවලින් වැලි ගොඩ දැමීම සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම බලපත්‍ර ලබාදීමේදී සැළකිල්ලට ගෙන ඇති පරිසර පනතේ නිර්දේශයන් කවරේද;

(iv) වැලි ප්‍රවාහනය සඳහා නීත්‍යානුකූල ක්‍රියාවලිය කවරේද;

(v) වැලි ගොඩ දැමීමේදී සිදුවන පරිසර හානිය නියාමනය කිරීම සඳහා සහ පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(vi) වැලි ගොඩ දැමීම සම්බන්ධයෙන් නව නීති රීති ගෙන ඒමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2020 මාර්තු 06 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

24/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික් සමූපකාර සමිති සංගම්වල නිලධාරින් පිරිසක් විදේශගත වූ බවට ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර මුදල් වංචා කර ඇති බවත්;

(ii) තවත් බොහෝ වංචා හා මූල්‍ය අක්‍රමිකතා මෙම සංගම්වල පවතින බවත්;

(iii) මේ හේතුවෙන් සමූපකාර ව්‍යාපාරය කෙරෙහි ඇති ජනතා ආකර්ශණය හා විශ්වාසය පළුදු වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සමූපකාර සමිති සංගම්වල සිදුවන මූල්‍ය අක්‍රමිකතා වැළැක්වීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) (අ) (ii) හි සඳහන් නිලධාරින්ට එරෙහිව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

67/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව විසින් පාසල් සිසුන්ට පොත් බෑග් ලබාදීම සඳහා මිල ගණන් කැඳවන ලද අංක 100, කඳන, ස්ප්‍රිංවැලි යන ලිපිනයේ පිහිටි, වීරසිංහ ඩිස්ට්‍රිබියුටර්ස් සමාගම පිළිබඳව විගණන විමසුමේ 2.2.1 (අ) i, ii සහ iii ඡේද යටතේ දැක්වෙන කරුණු ඉදිරිපත් කරන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

144/2020

ගරු බිමල් රත්නායක මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොටගල, සිරිපැරකුම් විදුහල ආසන්නයේ පිහිටා තිබූ කුකුල් ගොවිපොළ, පාසල් සංවර්ධන සමිතියේ හා ගුරු මණ්ඩලයේ විරෝධය හේතුවෙන් 2015 වර්ෂයේදී ඉවත් කරනු ලැබූ බවත්;

(ii) එම කුකුල් ගොවිපළ වෙනුවට, මේ වනවිට විශාල ප්‍රමාණයේ ගවගාලක් විවෘත කිරීමට කටයුතු කරනගෙන යන බවත්;

(iii) ගවගාලක් ස්ථාපිත කිරීමෙන් ආසන්නයේ පිහිටි සිරිපැරකුම් විදුහලේ ශිෂ්‍යයන්ගේ සෞඛ්‍ය තත්ත්වයට වන අහිතකර බලපෑම හේතුවෙන් පාසල් සංවර්ධන සමිතිය හා ගුරුමණ්ඩලය විරෝධය දක්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගවගාලක් ඉදිකිරීම හේතුවෙන් ශිෂ්‍යයන්ට විය හැකි හානිය සැලකිල්ලට ගෙන මෙම ගවගාල ඉදිකිරීම නැවැත්වීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

147/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට පැවති අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ පුරනැගුම ව්‍යාපෘතිය මඟින් බදුල්ල දිස්ත්‍රික්කය තුළ ඉදිකරනු ලැබූ දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කරනු ලැබූ මුදල කොපමණද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානවල ප්‍රමිතිය උසස් කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

154/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වී, එළවළු හා පලතුරු වගාවන් සඳහා හානිකර පළිබෝධකයන් හා දිලීර වර්ග කවරේද;

(ii) එකී පළිබෝධකයන් හා දිලීර වර්ග මඟින් හානිකරනු ලබන බෝග වර්ග කවරේද;

(iii) ආනයනය කරනු ලබන පළිබෝධනාශක වර්ග හා ඒවා නිෂ්පාදිත රටවල් කවරේද;

(iv) කෘෂි රසායනික භාවිතය හේතුවෙන් මහජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට අහිතකර බලපෑම් ඇතිවන බවත්, ඒ හේතුවෙන් බෝනොවන රෝග ඉහළයෑමේ අවදානමක් පවතින බවත් පිළිගන්නේද;

(v) ඉහත සඳහන් වගා උවදුරු මැඩ පැවැත්වීමට හා පාලනය කිරීම සඳහා දේශීය හා පරිසර හිතකාමී ක්‍රමවේද හඳුනාගෙන තිබේද;

(vi) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

25/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂය අවසන් වනවිට ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 60ට වැඩි ජනගහනය කොපමණද;

(ii) එම සංඛ්‍යාව රටේ සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

(iii) උක්ත ජනගහනයෙන් විශ්‍රාම වැටුපක් හෝ රජයෙන් ලබා දෙන වෙනත් දීමනාවක් ලැබෙන වැඩිහිටියන් සංඛ්‍යාව කොපමණද;

(iv) උක්ත ජනගහනයෙන් රජයෙන් ලබා දෙන කිසිදු දීමනාවක් නොලැබෙන වැඩිහිටියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සුභසාධනය සඳහා ලබාදුන් දීමනාව සඳහා අලුතින් ප්‍රතිලාභීන් එක් කර නොගන්නා බව දන්නේද;

(ii) එසේ නම්, නව ප්‍රතිලාභීන් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

68/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි වැඩසටහන යටතේ 'සමෘද්ධි ගෙවතු වගා' වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම වැඩසටහන මගින් අපේක්ෂිත අරමුණු කවරේද;

(iii) මෙම වැඩසටහන යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආරම්භ කර ඇති ගෙවතු සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම වැඩසටහන බදුල්ල දිස්ත්‍රික්කය තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

145/2020

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1605, තඹකන්ද ග්‍රාම නිලධාරි වසමේ, හිබුඩාව ග්‍රාමයේ, අංක 03 කෝවිල්කන්ද නමැති පෞද්ගලික භූමිය තුළ පුරාවිද්‍යා වටිනාකමක් සහිත නටඹුන් විශාල ප්‍රමාණයක් විසිරී පවතින බව දන්නේද;

(ii) 2014.06.11 දින මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යා කොමසාරිස් ජනරාල්වරයා විසින් අමාත්‍යාංශ ලේකම්වරයා හරහා එවකට පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට පිළිතුරක් යවා ඇති බවත්;

(iii) 2014.05.27 දින පුරාවිද්‍යා බලධරයන් පිරිසක් පැමිණ සිදු කළ ස්ථානීය පරීක්ෂාවට අනුව අක්කර පහක් පමණ විශාල වූ භූමි ප්‍රදේශයක පුරාවිද්‍යා නටඹුන් වශයෙන් ස්තූප ගොඩනැගිල්ලක්, නටඹුන් ගොඩනැගිලි දෙකක්, කණු පාදම් ගල්, පැරණි ගඩොල්, උළු හා මැටි බඳුන් කැබලි විසිරී ඇති බව තහවුරු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම භූමිය මායිම් කණු යොදා ආරක්ෂාව සඳහා වෙන් කිරීමටත්, එම ස්ථානය ආරක්ෂිත ස්මාරකයක් ලෙස ගැසට් කිරීම සඳහා ලියාපදිංචි කිරීමටත්, 2014 වර්ෂය තුළදීම කටයුතු කරන බවට දන්වා වර්ෂ පහකට ආසන්න කාලයක් ගතවී ඇතත්, මේ වනවිටත් එම කටයුතු ක්‍රියාවට නංවා නොතිබීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

148/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බැවිල හන්දියේ සිට රංවල හරහා උඩවෙල මාර්ගය වසර ගණනාවක සිට අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් දැඩි ලෙස අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය අයත්වන ආයතනය කවරේද;

(ii) මෙම මාර්ගය ගමනාගමනයට සුදුසු වන ලෙස අලුත්වැඩියා කිරීමට සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, අලුත්වැඩියා කිරීම ආරම්භ කරනු ලබන දිනය සහ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iv) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(v) මේ වනවිට එම මුදල් වෙන්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

155/2020

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016.02.23 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමතියෙන් ස්ථාපනය කරන ලද ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අරමුණු කවරේද;

(ii) එකී කොමිෂන් සභාව බලපැවැත්වූ දිනය හා කාලසීමාව කවරේද;

(iii) එහි සභාපතිවරයා ලෙස කටයුතු කළ පුද්ගලයාගේ නම, වැටුප් හා දීමනා කවරේද;

(iv) එම කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ නම්, වැටුප් හා දීමනා කවරේද;

(v) මෙතෙක් එම කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කරගත් ඉලක්ක හා අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 1/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳව අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳව ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 2/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා සීනි පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මඟින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 3/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන් හා පාසල් වෑන් රථ රියැදුරන් යන පිරිස් සඳහා දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේදයන් තුළින් සරළව පැහැදිලි කර, රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම සඳහා දරුවා සමාජ අභියෝගයන් හමුවේ ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සංවාදයක් පැවැත්වීමට ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධිමය දිළිඳු බව තුරන් කිරීම,— භෞතික වෙළෙඳ භාණ්ඩ සැරිසරන වේගයට සාපේක්ෂව දැනුම, බුද්ධිය හා මානව හර පද්ධතීන් ජනතාව වෙත ළඟා නොවීම හේතුවෙන් නොදැනුවත්කම හිස එසවීම තුළින් බුද්ධිමය දිළිඳුභාවය අද අප රට තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් වුවද, ඒ පිළිබඳව රට තුළ ඇත්තේ අඩු අවධානයක් බැවින්, රටේ ජනතාවගේ බුද්ධිමය දිළිඳු බව නැති කිරීමට සියලු වයස් කාණ්ඩයන් ආවරණය වන පරිදි විධිමත්ව සැලසුම් කරන ලද ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු අධ්‍යයන කේන්ද්‍රයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාවේ හා ලෝකයේ විවිධ රටවල පාර්ලිමේන්තු ක්‍රියාදාමයන්, පාර්ලිමේන්තු ඉතිහාසය හා දේශපාලන ක්‍රමවේද පිළිබඳ පාසල් සිසුන්ට, තරුණ තරුණියන්ට හා අනෙකුත් විද්‍යාර්ථයන්ට අධ්‍යයනය කිරීම සඳහා පහසුකම් සැලසිය හැකි පාර්ලිමේන්තු අධ්‍යයන කේන්ද්‍රයක් පාර්ලිමේන්තුව තුළ ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ දරුවන්ගේ සෞඛ්‍යයට ජනමාධ්‍ය හරහා සිදුවන බලපෑම අවම කිරීම,— අධික ලෙස ග්ලූකෝස්, මේදය හා ලුණු අඩංගු ආහාර වර්ග ගැනීමෙන් මෙරට ළමුන් අතර තරබාරුව, හෘදරෝග, අධිරුධිර පීඩනය ආදී බෝ නොවන රෝග ව්‍යාප්ත වෙමින් පවතින අතර මෙවැනි අහිතකර ආහාර වර්ග සඳහා ළමුන් පෙළඹවීමට ජනමාධ්‍ය හරහා ළමුන් ඉලක්ක කරගෙන සිදු කරනු ලබන වෙළෙඳ ප්‍රචාරණයන් ප්‍රධාන වශයෙන් හේතුවන බැවින් ළමා ආහාර සම්බන්ධයෙන් සිදු කරනු ලබන වෙළෙඳ ප්‍රචාරණයන් නියාමනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සංකීර්ණ ගෝලීය වෙළෙඳපොළ නිසා ජනතාවට ඇතිවන ගැටලු අවම කිරීම,— ගෝලීයකරණය විසින් හඳුන්වාදුන් ලෝක වෙළෙඳ රටාව මිනිසාගේ මනස ආක්‍රමණය කිරීම හේතුකොට ගෙන ඔහු පාරම්පරිකව ගෙන ආ හර පද්ධතීන් හා දියුණු දාර්ශනික චින්තනයන් මිනිස් මනස තුළින් උදුරා දැමීම වර්තමානය වනවිට ශ්‍රී ලාංකිකයින්ට ද පොදු බැවින්, වෙළෙඳපොළ ආර්ථිකය තුළ ගොඩනැගෙන සංකීර්ණ ජීවන රටාව හා ඒ සමඟ පැන නගින සංකීර්ණ සමාජීය ප්‍රශ්නත් විසඳා ගනිමින් සහනශීලී දිවි පැවැත්මකට යා යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් හා බුද්ධිමය සංවාදයක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසරය සුරැකීමෙන් නිරෝගී රටක් ගොඩනැගීම,— වර්තමාන ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය ඉහළ යාම හේතුවෙන් ජලයේ හා ආහාරවල විකිරණශීලී බව වැඩි වී ඇති අතර අනාගතයේදී මිනිසාට වැළඳෙන ඇතැම් රෝගවල රෝග නිධානය පවා සොයා ගැනීම අපහසු විය හැකි බැවින්, මේ පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර වාර්තාවක් කැඳවා, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ නීරෝගීභාවය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ ආරක්ෂාවට කෘෂිකර්මය සුරක්ෂිත කිරීම,— ධනවාදයේ තුන්වැනි කාර්තුව වන දෙවැනි ලෝක යුද්ධයෙන් පසු කාලයේදී හරිත විප්ලවයත් සමඟ කෘෂිකාර්මික ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වීම හේතුවෙන් වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දී ඇති පරිසර දූෂණය, නීරෝගී බව නැතිවීම, පිරිසිදු ආහාර නොමැතිවීම ආදී අවදානම් තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව තිරසාර කෘෂිකර්ම භාවිතයන්ට පෙළඹවීමෙන් හා ගොවීන් ආරක්ෂා කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්ති රට තුළ ස්ථාපිත කරවීමෙන් රටේ අනාගතය සුරක්ෂිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මාතෘ හා ළමා මන්දපෝෂණය තුරන් කිරීම,— ශ්‍රී ලංකාව තුළ අඩුබර දරු උපත් අනුපාතිකය 25% තරම් ඉහළ අගයක් ගන්නා අතර එයට ප්‍රධාන සාධකය වන්නේ පෝෂ්‍යදායී ආහාර හිඟකම වන බැවින්, මාතෘ හා ළමා මන්දපෝෂණය දුරලීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර දුප්පත් ජනතාවට ලබා දීම ප්‍රමුඛතාවය කරගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කිරීම,— රටක සංවර්ධනය සඳහා තොරතුරු වැදගත් සාධකයක් වන අතර, එම තොරතුරු සම්පාදනයේදී වැදගත් මෙහෙවරක් ඉටුකරන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගැටලු විසඳීමට යාන්ත්‍රණයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2020

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වූ පවුල් සඳහා සහන සලසාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භූගත උමං මාර්ග කැණීම හේතුවෙන් බණ්ඩාරවෙල, ලියන්ගහවෙල ප්‍රදේශයේ ජනතාවට සිය නිවාස, ඉඩම් ඇතුළු දේපළ අහිමි වී මේ වනවිට වසර තුනක කාලයක් ගතවී තිබුණ ද, අවතැන් වූ එම ජනතාවට මෙතෙක් කිසිදු වන්දි මුදලක් හෝ සහනයක් ලැබී නොමැති බැවින්, එම ජනතාවට සහන සලසා දීමේ වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2020

ගරු හේෂා විතානගේ මහතා,— දුම්රිය මඟින් එළවළු ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම,— බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු එළවළු නිෂ්පාදනය කරන දිස්ත්‍රික්කවල සිට එළවළු ගොවීන්ගේ නිෂ්පාදන අඩු පිරිවැයකින්, අපතේ යෑම අවම කරමින් දුම්රිය මඟින් රටේ සෙසු ප්‍රදේශවල වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2020

ගරු හේෂා විතානගේ මහතා,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජල හිඟයකට මුහුණ දී සිටින ජනතාවට ජල පහසුකම් ලබාදීම,— උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07ක පවුල් 8394ක ජනතාවට උග්‍ර ජල හිඟයකට මුහුණ පෑමට සිදුවී ඇති බැවින්, එම ජනතාවට අවශ්‍ය ජල පහසුකම් ලබාදීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2020

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම,— අයහපත් කාලගුණය සහිත කාලසීමාවන්වලදී නිරන්තරයෙන්ම ගංවතුරින් ආපදාවට ලක්වන රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීමට වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19 /2020

ගරු හේෂා විතානගේ මහතා,— අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කිරීම,— කලාව, ක්‍රීඩාව ආදී බොහෝ අංශවල සබරගමුවට උරුම ආවේණික ලක්ෂණ ඇති අතර අද වනවිට වාණිජකරණය හමුවේ එම ආවේණික ලක්ෂණ අභාවයට යාමේ අවදානමක් ඇති බැවින් අනාගත පරපුර වෙනුවෙන් සබරගමුවට ආවේණික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2020

ගරු හේෂා විතානගේ මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා අවම කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් නිකුත් කරන ලද වාර්තාවන්ට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ආපදා තත්ත්වයන්ට ලක්වීමේ අවදානමක් සහිත ස්ථාන රාශියක් ඇති බව පෙන්වා දී ඇති බැවින්, එම තත්ත්වයන් අවම කිරීම සඳහා යම් වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2020

ගරු රවි කරුණානායක මහතා,— දේශපාලනඥයන් විසින් මුඛ මෙන්ම ආගම් අතර නොසන්සුන්කාරී තත්ත්වයන් නිර්මාණය කරන අනවශ්‍ය සහ කුපිත කරවන සුළු ප්‍රකාශ සිදු කිරීම වැළැක්වීම,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වැනි ව්‍යවස්ථාවේ (සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස) සඳහන් වී ඇති පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කිරීමට දිවුරුම් දී ඇති කිසිදු දේශපාලනඥයෙකු හට ප්‍රසිද්ධියේ මුඛ හෝ අනවශ්‍ය මෙන්ම කුපිත කරවන සුළු ප්‍රකාශයක්, වෛරී ප්‍රකාශ, ආගම් අතර නොසන්සුන්කාරී තත්ත්වයන් නිර්මාණය කරන, ආගම් අවඥාවට ලක් කරන හෝ හෙළා දකින ප්‍රකාශ සිදු කළ නොහැකි බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.